## 8. දිරියදරු ප්‍රණාම ශිෂ්‍යත්ව

මෙම ව්‍යාපෘතිය 2002 වර්ෂයේ සිට අඛණ්ඩව ක්‍රියාත්මක වන අතර, සාමාජිකයන්ගේ දූ දරුවන්ගේ අධ්‍යාපනික ජයග්‍රහණ සහ කුසලතා ඇගයීම එහි ප්‍රධාන අරමුණ වේ. පහ වසර ශිෂ්‍යත්ව විභාගය සමත් වන සහ අ.පො.ස. උසස් පෙළ විභාගය සමත් වී විශ්වවිද්‍යාල ප්‍රවේශය ලබන දූ දරුවන්ගේ ඉදිරි අධ්‍යාපන කටයුතු සඳහා දිරිගැන්වීම සහ ඔවුන්ගේ සාර්ථකත්වය අගය කිරීම මෙම ව්‍යාපෘතිය මඟින් සිදු කරනු ලබයි.

මෙම සමාජ සංවර්ධන හා සුභසාධන වැඩසටහන සාමාජිකත්වය අතර ඉතා ජනප්‍රිය ව්‍යාපෘතියක් බවට පත්ව ඇති අතර, වර්තමානයේ දිවයින පුරා විසිරී සිටින සාමාජිකයන්ගේ දූ දරුවන්ගේ කුසලතා ඇගයීම සඳහා "දිරිය දරු ප්‍රණාම" ශිෂ්‍යත්ව වැඩසටහන් පළාත් මට්ටමින් ඉතා උත්කර්ෂවත් අන්දමින් සංවිධානය කරනු මෙම ලබයි.

එමඟින්,

1. දරුවන්ගේ දක්ෂතා ඇගයීම.
2. සාමාජික මහත්ම මහත්මීන්ගේ අපිරිමිත ධෛර්ය ඇගයීම.
3. මූල්‍ය ත්‍යාගයක් / පොත් කටලයක්/සහතිකයක්/ කුසලානයක් පිරිනැමීම.